සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

16 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

| | |
|---|---|
| ඉස්ලාම් | I, II |
| இஸ்லாம் | I, II |
| Islam | I, II |

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

## ඉස්ලාම් I

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරා ගන්න.
(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** නබි මුහම්මද් (සල්) තුමාට ප්‍රථමයෙන් ම පහළ කළ වාක්‍යය,
(1) බිස්මිල්ලාහි වේ. (2) අලිෆ් ලාම් මීම් වේ. (3) ඉක්රඃ වේ. (4) යාසීන් වේ.

**2.** නබිවරුන් පව්වලින් ආරක්ෂා කරනු ලැබූවන් බව දක්වන වචනය,
(1) මුඃජිසාත් ය. (2) ඉස්මත් ය. (3) රහ්මත් ය. (4) හිදායත් ය.

**3.** වහල් භාවයෙන් නිදහස ලබා පළමුවෙන් ම ඉස්ලාමය වැළඳගත් පුද්ගලයා කවුද?
(1) අම්මාර් (රළි) ය. (2) බිලාල් (රළි) ය. (3) සෙයිද් (රළි) ය. (4) මුස්අබ් (රළි) ය.

**4.** පහත **'අ'** යටතේ පද කිහිපයක් ද **'ආ'** යටතේ ඒවායේ තේරුම ද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) රිබා | A - අත්තිකාරම් ගෙවීම |
| (ii) සලම් | B - කුලියට දීම |
| (iii) ඉජාරා | C - හවුල් ව්‍යාපාරය |
| (iv) මුෂාරකා | D - පොලිය |

මෙහි **'ආ'** තීරුව **'අ'** තීරුව සමග නිවැරදි අනුපිළිවෙළට ගළපා ඇති වරණය කුමක් ද?
(1) A, B, C, D (2) B, D, A, C (3) C, B, D, A (4) D, A, B, C

**5.** 'ඉක්ලාස්' යන වචනයේ අදහස කුමක් ද?
(1) ප්‍රවේසම් වීම (2) දේව බැති බිය (3) පිරිසිදු සිත (4) අල්පේච්ඡ ජීවිතය

**6.** නීති ක්ෂේත්‍රයට අදාළ කරුණුවලට සම්බන්ධ කලාව,
(1) ඉල්මුල් ෆරාඉල් ය. (2) ඉල්මුල් ෆික්හ් ය. (3) ඉල්මුන් නෆ්ස් ය. (4) ඉල්මුල් අකීදා ය.

**7.** කරුණු දෙකක් සම්බන්ධයෙන් අල්ලාහ් තමාගෙන් උදව් ඉල්ලන ලෙස අල්-කුර්ආන් වාක්‍යයක දක්වා ඇත. ඉන් එකක් සලාතය වන අතර අනෙක
(1) තිලාවතුල් කුර්ආන් ය. (2) සදකා ය. (3) ඉවසීම ය. (4) සව්ම ය.

**8.** 'තක්බීර් තහ්රීමා' යනු,
(1) අල්ලාහු අක්බර් යන්න ය. (2) සලාතය සඳහා බඳින පළමු තක්බීරය ය.
(3) හජ් කාලයේ උසුරන තල්බියා ය. (4) නබිතුමා දිනපතා පාරායනය කළ දුආ ය.

**9.** ලේ නෑයන් ඇතුළත් මහ්රම් වන්නේ කවුරුන් ද?
(1) පියාගේ සොහොයුරිය (2) ලේලි (3) බිරිඳගේ සොහොයුරිය (4) බිරිඳගේ දුව

**10.** පහත සඳහන් ඒවායින් කුලෆාඋර් රාෂිදූන් සම්බන්ධ **වැරදි** ප්‍රකාශය වනුයේ,
(1) සුවනය පිළිබඳ පුරෝකථනය කළ අයයි. (2) නබිතුමා සමග විවාහ සම්බන්ධතා සහිත අයයි.
(3) වෙන් වෙන් අන්වර්ථ නම්වලින් හැඳින්වූ අයයි. (4) මදීනාව තම අගනුවර ලෙස තබා ගත් අයයි.

[ දෙවැනි පිටුව බලන්න

**11.** සුන්නත් වූ සව්මය සමාදන් වීමට අවකාශ **නොමැති** මාසය,
(1) රමළාන් මාසය වේ. (2) රජබු මාසය වේ. (3) ෂව්වාල් මාසය වේ. (4) ෂඃබාන් මාසය වේ.

**12.** පහත සඳහන් අවස්ථාවලින් විවාහය හරාම් වනුයේ,
(1) කාන්තාවන් තිදෙනකු සමග විවාහ වී දික්කසාද වූ පසු, හතර වන විවාහයට වෑයම් කිරීම ය.
(2) බිරින්දෑවරුන් හතරදෙනකු සමග ජීවත්වන අයකු පස්වන විවාහයට කැමති වීම ය.
(3) පළමු බිරිඳගේ කැමැත්ත නොලබා විවාහ වීම ය.
(4) බිරිඳ ජීවත් ව සිටිය දී ඇය හා එක් කුසේ උපන් ඇගේ සොයුරිය විවාහ කර ගැනීම ය.

**13.** අම්මාර් ව්‍යාපාරයක් ආරම්භ කර, අවුරුද්ද අවසානයේ රුපියල් 200 000 ක ණය හා රුපියල් 850 000 ක මුදලක් ඉතිරිව තිබුණි. එම වසරේ රත්රන් පවුමක් රුපියල් 50 000 ක් විය. අම්මාර් ගෙවිය යුතු සකාත් ප්‍රමාණය,
(1) රු 2500 කි. (2) රු 13 750 කි. (3) රු 16 250 කි. (4) රු 26 250 කි.

**14.** 'ජබීරත්' යනු,
(1) දූවිලි සහිත පිරිසිදු පස වේ. (2) තුවාලයට දමන වෙළුම වේ.
(3) වරදට ප්‍රතිකර්මය වේ. (4) මුහුණ වසන රෙද්ද වේ.

**15.** පහත **'අ'** තීරුවේ කර්තෘවරුන් කිහිප දෙනෙකුගේ නම් ද **'ආ'** තීරුවේ ඔවුන් විසින් රචනා කරන ලද ග්‍රන්ථ කිහිපයක නම් ද දැක්වේ.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) සිද්දි ලෙබ්බේ | A - අජාඉබුල් හින්ද් |
| (ii) එමර්සන් ටෙනන්ට් | B - අසන්බේ සරිත්තිරම් |
| (iii) ඉබ්නු සහ්රයාර් | C - සිලෝන් |

මෙහි **'අ'** තීරුවට අනුව **'ආ'** තීරුව ගැළපූ විට ලැබෙන නිවැරදි වරණය කුමක් ද?
(1) A, B, C (2) B, C, A (3) C, A, B (4) D, B, C

**16.** 'ෆර්ලු ඓන්' යනු,
(1) සෑම මුස්ලිම්වරයකු ම අනිවාර්යයෙන් ම ඉටු කළ යුතු ඒවා ය.
(2) මුස්ලිම්වරුන් සමූහ වශයෙන් පමණක් ඉටු කළ යුතු ඒවා ය.
(3) සෑම අයෙකු ම තම කැමැත්ත අනුව ඉටු කළ යුතු ඒවා ය.
(4) ප්‍රජාවගෙන් පිරිසක් හෝ අනිවාර්යයෙන් ම ඉටු කළ යුතු ඒවා ය.

**17.** නබි මුහම්මද් (සල්) තුමාගෙන් පසුව මස්ජිදුල් අක්සාවේ සලාතය ඉටු කළ ප්‍රථම පුද්ගලයා,
(1) සුල්තාන් සලාහුද්දීන් අයියුබි ය. (2) කලීෆා අබුබක්ර් (රළි) ය.
(3) සුල්තාන් මුහම්මද් අල්-ෆාතිහ් ය. (4) කලීෆා උමර් (රළි) ය.

**18.** ඉද්රිස් (අලයි) තුමාට ලබා දුන් 'සුහුෆු' සංඛ්‍යාව,
(1) 10කි. (2) 30කි. (3) 40කි. (4) 50කි.

**19.** 'දුආඋල් ඉස්තිෆ්තාහ්'හි "ඉන්න සලාතී..." යන්න සමග ම එන වාක්‍යාංශය කුමක් ද?
(1) "වමහ්යාය වමමාතී" (2) "වනුෂ්කී වමහ්යාය" (3) "නුස්කී වසලාතී" (4) "වනුෂ්කී වමමාතී"

**20.** පහත දක්වා ඇත්තේ ඉස්ලාමීය ද්විතීය මූලාශ්‍ර කිහිපයකි.

| 'අ' | 'ආ' |
|---|---|
| (i) ඒකමතික තීරණය | A - අල්-උර්ෆු |
| (ii) සංසන්දනය කිරීම | B - අල්-ඉජ්මා |
| (iii) සම්ප්‍රදාය | C - මස්ලහා මුර්සලාහ් |
| (iv) සමාජ සුභසාධන රැකීම | D - අල්-කියාස් |

මෙහි **'අ'** තීරුවේ ඒවායේ අනුපිළිවෙළට **'ආ'** තීරුවේ ඒවා ගැළපූ විට ලැබෙන නිවැරදි වරණය කුමක් ද?
(1) A, B, C, D (2) A, C, B, D (3) B, D, A, C (4) C, D, A, B

**21.** විවාහයේ දී ඊජාබ්-කබූල් යන දෙකට ම අයිති අය වනුයේ,
(1) මනාලයා, මනාලිය ය. (2) වලී, මනාලයා ය. (3) කාළි, වලී ය. (4) මනාලයා, කාළි ය.

**22.** අල්ලාහ් අනුමත කළ ඒවායින් ඔහුට වඩාත් අකමැති දෙය බව දක්වා ඇත්තේ,
(1) බහු භාර්යා විවාහය ය. (2) වෙළඳාම ය. (3) බාරවීම ය. (4) තලාක් ය.

**23.** 10 ශ්‍රේණියේ සිසුන් චාරිකාවකට සහභාගි විය. දහවල් කාලය පුරා ම ගමනට හා ස්ථාන නැරඹීමට සැලසුම් කර තිබුණි. මෙම චාරිකාවේ දී ලුහර් සලාතයට නියම වේලාව පැමිණි විට එය ඉටු කරන්නේ කෙසේ ද යන ප්‍රශ්නය මතු විය. මෙවැනි අවස්ථාවක ගත හැකි නිවැරදි ම තීරණය පහත සඳහන් ඒවායින් කවරක් ද?
(1) ලුහර්, අසර් සලාත ඒවාට නියමිත වේලාවල දී ඉටු කිරීම
(2) ජම්මුත්තක්දීම් නැතහොත් ජම්මුත් තෘකීර් කිරීම
(3) දැනට අවශ්‍ය පහසුකම් නොමැති බැවින් රාත්‍රි නවාතැන් ගන්නා ස්ථානයේ දී කලා කිරීම
(4) ගමනේ දිගට ම යෙදී අතරමග පහසුකම් ඇති ස්ථානයක් ලැබුණු විටෙක එහි දී සලාතය ඉටු කිරීම

/ තුන්වැනි පිටුව බලන්න

24. "සැබවින් ම මා යහගුණ සම්පූර්ණ කිරීම සඳහා ම යවනු ලැබ ඇත." යන වාක්‍යය
(1) අල්-කුර්ආන් වාක්‍යයකි. (2) අල්-හදීස් වාක්‍යයකි. (3) සහබාවරුන්ගේ ය. (4) ඉමාම්වරුන්ගේ ය.

25. කියාස් අවස්ථාවේ දී විසඳිය යුතු නව ප්‍රශ්නයක් හඳුන්වන්නේ කෙසේ ද?
(1) අස්ල් (2) ෆර්උ (3) හුක්ම් (4) ඉල්ලත්

26. 'කුල්උ' යනු,
(1) භාර්යාව සැමියාගෙන් දික්කසාද ඉල්ලීම ය.
(2) තලාක් තුන ම එකවර කීම ය.
(3) විවාහය වලංගු නොවන තත්ත්වයට පත්වීම ය.
(4) සැමියා විසින් බිරිඳ දික්කසාද කිරීම ය.

27. 'ඉජ්තිහාද්' යනු කුමක් ද?
(1) ඉස්ලාමීය නීති විශාරදයින්ගේ හමුව
(2) උපදේශක සභාව
(3) ගැටලුවකට විසඳුම් සෙවීමට ගන්නා වෑයම
(4) ඉස්ලාමීය නීති ක්ෂේත්‍රයේ ආයතන

28. සකාතයේ ෆර්ලු දෙකෙන් එකක් නියයත් තැබීම වන අතර අනෙක
(1) නිසාබයට ළඟා වී තිබීම ය.
(2) ගණන් බලා ගෙවීම ය.
(3) සුදුසු අයට දීම ය.
(4) සමාජ සුභසාධන කටයුතුවලට ප්‍රමුඛතාව දීම ය.

29. 'උම්මතන් වසතන්' යන්නෙන් බලාපොරොත්තු වනුයේ,
(1) මධ්‍යස්ථ සමාජයක් ය.
(2) සහයෝගයෙන් ජීවත් වීම ය.
(3) දැඩි මත දැරීම ය.
(4) නිශ්ශබ්දව සිටීම ය.

30. රිසානා ගර්භිණී ව සිටි විට ඇයගේ සැමියා 2014.10.10 දින මළේ ය. ඇයට 2015.06.10 වන දින දරුවකු ලැබිණි. ඇය ඉද්දා අනුගමනය කළ යුතු කාලය නිශ්චිතව ම
(1) 2015.10.10 දක්වා ය. (2) 2015.06.10 දක්වා ය. (3) 2015.02.20 දක්වා ය. (4) 2015.01.10 දක්වා ය.

31. ජල ආකාර අතුරින් 'අල්මා උත් තහූර්' යනු
(1) වැඩිපුර ජලයයි. (2) පිරිසිදු ජලයයි. (3) ඉතා පිරිසිදු ජලයයි. (4) භාවිතයට ගත් ජලයයි.

32. 'මිනිසා අල්ලාහ්ගේ නියෝජිතයා ය.' යන්න දක්වන වචනය කුමක් ද?
(1) කලීෆතුල්ලාහ් (2) හබීබුල්ලාහ් (3) රසූලුල්ලාහ් (4) කලීමුල්ලාහ්

33. හදීස් සඳහන් කරන පරිදි මූ'මින් කෙනෙකු හා කාෆිර් කෙනෙකු අතර වෙනස කුමක් ද?
(1) අරාබි බස දැන සිටීම
(2) සලාතය අත හැරීම
(3) සලාම් කීම
(4) අසාධාරණයට විරුද්ධව හඬ නැගීම

34. නබිතුමාගේ ඉස්ලාමීය ප්‍රචාරක කටයුතුවලට දැඩි විරෝධය පෑ නබිතුමාගේ පවුලේ ම පුද්ගලයා කවුරුන් ද?
(1) වලීද් බින් මුගීරා (2) උබයි බින් කලබ් (3) අබ්දුල්ලාහ් බින් අබී රබීහ් (4) අබූ ලහබ්

35. 'වෙළඳාමේ බරකතය නැති කරයි' යැයි නබිතුමා විසින් අවධාරණය කරන ලද කරුණ,
(1) මිනුම්වල වංචා කිරීම ය.
(2) බොරුවට දිවිරීම ය.
(3) භාණ්ඩ සඟවා තැබීම ය.
(4) සේවකයන්ගේ වැටුප් පමා කිරීම ය.

36. 'කුෆ්ර්' යන්නෙහි තේරුම,
(1) අල්ලාහ්ට සමව තවත් යමක් නැමදුමට සුදුස්සකු ලෙස සැලකීම ය.
(2) නැමදුමට සුදුස්සා ලෙස අල්ලාහ් පිළි නොගැනීම ය.
(3) ආගම වෙනස් කිරීම ය.
(4) දෙවියන් නැතැයි කීම ය.

37. නුස්රි ගමේ මස්ජිදය සමග ඉතා කිට්ටු සම්බන්ධතාවක් ඇති තරුණයෙකි. ඔහු ලුහර් සලාතය සඳහා යන විට මෝටර් රථ අනතුරකින් දැඩි ලෙස තුවාල වූ අයකු දුටුවේ ය. මේ අවස්ථාවේ ඔහු ප්‍රමුඛතාව දී කළ යුත්තේ,
(1) ඉක්මනින් මස්ජිදයට ගොස් සලාතය ඉටු කර රෝගියා රෝහලට කැඳවා ගෙන යාම ය.
(2) කවුරුන් හෝ රෝගියා රෝහලට කැඳවා ගෙන යනු ඇතැයි සිතා මස්ජිදයට යෑම ය.
(3) වහාම රෝගියා රෝහලට කැඳවා ගෙන යාම ය.
(4) රෝගියා රෝහලට ගෙන යාම වෙනත් අයෙකුට පැවරීම ය.

38. මුහද්දිස් යනු,
(1) හදීස් ක්ෂේත්‍රයේ විද්වතෙකි.
(2) ෆික්හ් ක්ෂේත්‍රයේ විද්වතෙකි.
(3) අල්-කුර්ආන් පහදා දීමේ නිරත වූවෙකි.
(4) මස්හබයක් අනුගමනය කළ අයෙකි.

39. පිරිසිදු ඉස්ලාමය සුරැකීමේ අරමුණින් ඉමාම් අහ්මද් බින් හන්බල් (රහ්) තුමාගේ දැඩි විරුද්ධත්වයට ලක් වූ මතධාරීන්
(1) මුඃතසිලාවරුන් ය. (2) ෂිආවරුන් ය. (3) ඛාරිජිවරුන් ය. (4) මුර්ජිආවරුන් ය.

40. අල්-කුර්ආනය ගොනු කිරීමේ කාර්යයේ නිරත වූ කලීෆාවරුන් වන අබූබක්ර් (රළි) ගේ හා උස්මාන් (රළි) ගේ කාලවල එයට ප්‍රධාන වශයෙන් දායක වූ සහාබිවරයා,
(1) හුදයිෆතුල් යමානි (රළි) ය.
(2) සෛද් බින් සාබිත් (රළි) ය.
(3) සඃද් බින් අබී වක්කාස් (රළි) ය.
(4) මුආවියා බින් අබූ සුෆ්යාන් (රළි) ය.

* *

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது [All Rights Reserved]

නව නිර්දේශය/புதிய பாடத்திட்டம்/New Syllabus

NEW

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

16 S I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2017 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2017 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2017

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

## ඉස්ලාම් II

* **පළමුවන** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.
* පළමුවන ප්‍රශ්නයට ලකුණු **20** ක් ද, තෝරා ගන්නා එක් ප්‍රශ්නයකට ලකුණු **10** බැගින් ද හිමි වේ.

**1.** කෙටි පිළිතුරු සපයන්න.

(i) නජීස්හි ආකාර **දෙකක්** සඳහන් කරන්න.
(ii) ෆික්හ් ක්ෂේත්‍රයට දායක වූ ඉමාම්වරුන් **දෙදෙනාගේ** නම් ලියන්න.
(iii) කුෆ්ර් ඇති කරන ක්‍රම **දෙකක්** සඳහන් කරන්න.
(iv) හජ් සහ උම්රා යන අමල්හි අනුගමනය කළ යුතු ෆර්ල් වූ කරුණු **දෙකක්** ලියන්න.
(v) ඉජ්තිහාද් අනුමත කරන ලද්දක් බව දක්වන කුර්ආන් වාක්‍යයක් සඳහන් කරන්න.
(vi) 'ලිහාර්' යන්න දික්කසාදයෙන් අවසන් වන අවස්ථාව පැහැදිලිව දක්වන්න.
(vii) ඉස්ලාමය අනුව දෛවය විශ්වාස කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන **දෙකක්** සඳහන් කරන්න
(viii) ශ්‍රී ලංකාවේ ඉස්ලාම් හඳුන්වා දීම පිළිබඳ අදහස් ඉදිරිපත් කර ඇති අරාබි ග්‍රන්ථ **දෙකක්** නම් කරන්න.
(ix) ෂරීආවේ දෘෂ්ටිය අනුව විවාහයේ අරමුණු **දෙකක්** දක්වන්න.
(x) ඉපැයීම නැමදුමක් කර ගත හැකි මඟ පෙන්වීම් **දෙකක්** ලියන්න.

**2.** (i) 'මුඃජිසාත්' යනු කුමක් ද?
(ii) රසූල්වරුන්ට ලැබුණු ආශ්චර්ය **තුනක්** සඳහන් කරන්න.
(iii) අල්-කුරාන් සඳහන් කරන ආශ්චර්ය **පහක්** ලැයිස්තුගත කරන්න.

**3.** (i) 'හදීස්' යන්නෙහි ඉස්ලාමීය පාරිභාෂික තේරුම සඳහන් කරන්න.
(ii) හදීස් සුරැකීම සඳහා අනුගමනය කළ ක්‍රමවේද **තුනක්** දක්වන්න.
(iii) ඉමාම් මුස්ලිම් (රහ්) ගේ හදීස් ක්ෂේත්‍රයේ දායකත්වය කෙටියෙන් විස්තර කරන්න.

**4.** (i) ඉස්ලාමයේ විනයට හිමි වැදගත්කම කුමක් ද?
(ii) සූරා ලුක්මාන් පවසන විනය හා බැඳුණු ගතිලක්ෂණ **තුනක්** සඳහන් කරන්න.
(iii) අබුබක්ර් (රළි) තුමා තම කිලාෆතයේ දී ඉටු කළ සේවා **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න.

**5.** (i) සකාත් සාමූහික වගකීමක් බව අල්-කුරාන් හෝ අල්-හදීස් හෝ මගින් සනාථ කරන්න.
(ii) ඉවසීමට හිමි අවස්ථා **තුනක්** හා එහි දී අනුගමනය කළ යුතු ඉවසීමේ ආකාර **තුනක් ද** දක්වන්න.
(iii) සන්නිවේදන මාධ්‍ය ලබා තිබිය යුතු ගුණාංග **පහක්** පැහැදිලි කරන්න.

**6.** (i) මස්ජිදුල් අක්සාව හඳුන්වන්න.
(ii) පුරුෂයකුට එකවර විවාහ වීමට තාවකාලිකව තහනම් කර ඇති **තිදෙනකු** සඳහන් කරන්න.
(iii) මානසික සෞඛ්‍යය ශක්තිමත් කිරීම සම්බන්ධ යෝජනා **පහක්** ඉදිරිපත් කරන්න.

**7.** පහත සඳහන් ඒවායින් **දෙකක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) තස්කියතුන් නෆ්ස්
(ii) ඉපැයීමේ වැදගත්කම
(iii) අබුබක්ර් (රළි) තුමාගේ කාලයේ අල්-කුර්ආන් ගොනු කිරීම
(iv) ලෞකික ජීවිතය පිළිබඳ ඉස්ලාමීය දෘෂ්ටිය

* * *